සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No   DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No   ........................ | දිනය<br>திகதி<br>Date   2021.12.30 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2021/20 ට පළමු එකතුව**

**සියළුම පාලක මණ්ඩල/ විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන් වෙත,**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වර්ෂ අවසාන ගිණුම් පියවීම සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරිම - 2021</u>**

01. සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/20 ට අනුව 2021 වර්ෂය සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය උපදෙස් දැනටමත් නිකුත් කර ඇත. එම චක්‍රලේඛයේ ඡේද අංක 4 හි සඳහන් පරිදි බොල් ණයකරුවන් හඳුනාගැනීම සහ ප්‍රතිපාදන වෙන් කිරීමට නියමිතව තිබුණත් පහත කරුණු හේතු කරගෙන 2021 වර්ෂයේ අවසාන කාර්තුව සඳහා බොල් ණය වෙන් නොකිරීමට අදහස් කර ඇත.

- **I.** කොරෝනා වසංගත තත්ත්වය හේතු කරගෙන ඇති වූ බලපෑම මත ණයකරුවන්ගේ ආදායම් අහිමිවීම මත ණය ගෙවීමට අපහසු වී ඇති බව නිරීක්ෂණය වී ඇත.
- **II.** 2021 මැයි 15 සිට අගෝස්තු 31 දක්වා කාලය තුල ණයකරුවන්ට ණය ගෙවීමට සහනයක් වශයෙන් ඉදිරි මාස 03 ක් ලබාදීම සිදුකල අතර, එම සහනය යටතේ ණය ගෙවීම තවදුරටත් සිදුවෙමින්පවතී.
- **III.** කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සෘජුවම බලපෑමට ලක් වූ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යාපෘතිකරුවන් ඇතුළු හඳුනාගත් විශේෂ ව්‍යාපෘතිකරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක ප්‍රතිලේඛනගත කිරීමෙන් වැඩසටහන 2022.02.28 දක්වා පවතින බැවින් ද,
- **IV.** සමෘද්ධි බැංකු/ බැංකු සමිති සමඟ විශ්වාසනීත්වය ඇතිකරගත්, ඉතා දිගු කාලයක් ණය ගණුදෙනුකරුවන් ලෙස කටයුතු කර සාමාජිකයන් ද මෙම තත්ත්වය තුල ණය පැහැර හැරීම් ණයකරුවන් ලෙස හඳුනාගැනීමට සිදුවන අතර, ඔවුන්ට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සිදුවීම හේතු කරගෙන තවදුරටත් සමෘද්ධි බැංකු ණය දීමට නොහැකි බැවින් එවැනි ගණුදෙනුකරුවන් අපට අහිමිවීමට ඉඩ ඇත.

**2.** ඉහත කාරණා සම්බන්ධව සමෘද්ධි බැංකු/ බැංකු සමිති කාර්ය මණ්ඩල සහ ප්‍රජා නායකයන්ගෙන් ලද ඉල්ලීම් සලකා බලා 2021.12.31 දින බොල් ණයකරුවන් හඳුනාගැනීම සහ බොල්ණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම නොකරන ලෙස දැනුම් දෙමි.

**3.** එනමුත් 2022.02.28 දිනට දී ඇති උපදෙස් පරිදි ණයකරුවන් තවදුරටත් ණය මුදල් පැහැර හැර ඇත්නම් එදිනට බොල් ණය වෙන්කිරීම් සුපුරුදු පරිදි සිදුකල යුතු බව ද දන්වා සිටිමු. මෙම කාර්ය පරිගණක මෘදුකාංගය තුලද එලසින් සිදු කල යුතුය.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස.හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |